VIDUMINI PRATHIBHA

SEASON 02

Competition & Concert

2026

REGISTRATION IS OPEN NOW

https://external.sjp.ac.lk/

DEADLINE: 30 NOVEMBER 2026

DANCE | SINGING

Faculty of Humanities and Social Sciences with
External Degrees and Extension Courses Unit
University of Sri Jayewardenepura

විදුමිණි ප්‍රතිභා
නර්තන, ගායන තරඟාවලිය සහ කලා ප්‍රසංගය - 2026/2027

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය සහ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය එක් ව ක්‍රියාත්මක කැරෙන 'විදුමිණි' නිපුණතා අභිවර්ධන ප්‍රයාසය මගින් **මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ** බාහිර උපාධි අපේක්ෂකයන්ගේ නිර්මාණශීලී ශක්‍යතා අභිවර්ධනය උදෙසා 'විදුමිණි ප්‍රතිභා' තරඟාවලිය සහ කලා ප්‍රසංගය සංවිධානය කරනු ලබයි.
- ඒ අනුව ශාස්ත්‍රවේදී/සමාජීය විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවන්හි දැනට අධ්‍යයන කටයුතුවල නියැලෙන (**2022, 2023, 2024, 2026 යන අධ්‍යයන වර්ෂවල**) විද්‍යාර්ථීන්හට මේ සඳහා සහභාගී වීමේ අවස්ථාව හිමි වනු ඇත.
- තරඟාවලිය **නර්තන** සහ **ගායන** වශයෙන් අංශ 02ක් යටතේ වෙන් වෙන් ව පවත්වනු ලබයි.
- විද්‍යාර්ථීන්ගේ අභිමතය පරිදි එක් අංශයකට හෝ අංශ සියල්ලට ම හෝ ඉදිරිපත් වීමේ හැකියාව පවතී.
- සියලු ම අංශවලට අදාළ තරඟ **වට 02 බැගින්** පැවැත්වේ.
- සියලු ම තරඟ අංශ **ඒකල ගැහැනු** සහ **ඒකල පිරිමි** වශයෙන් වෙන් වෙන් ව පැවැත්වේ.
- අවසන් තරඟ වටය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බණ්ඩාරනායක ශාලාවේ දී **කලා ප්‍රසංගයක් ආකාරයෙන්** පැවැත්වෙන අතර සෑම අංශයක ම පළමු තරඟ වටයෙන් තේරී පත් වන විද්‍යාර්ථීන්හට ප්‍රාසංගික වේදිකාවේ දී අවසන් වටය සඳහා තරඟ වැදීමට අවස්ථාව හිමි වේ. (පළමු වටයට සහභාගී වන තරඟකරුවන්ගේ ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් අවසන් වටයට තෝරාගන්නා ජයග්‍රාහකයන් ප්‍රමාණය තීරණය කිරීමේ අයිතිය සංවිධායක මණ්ඩලය සතු ය.)
- අවසන් වටයට තේරී පත් නොවන තරඟකරුවන්ගේ කුසලතා මට්ටම සැලකිල්ලට ගනිමින් සමූහ ප්‍රාසංගික අංග (නර්තන, ගායන) සඳහා ඉදිරිපත් වීමේ අවස්ථාව ලබා දෙනු ඇත.
- එම සමූහ ඉදිරිපත් කිරීම් සඳහා ද සුදුසුකම් නොලබන අනෙකුත් තරඟකරුවන්ට ඉසව් කළමනාකරුවන් වශයෙන් උත්සව සංවිධාන කටයුතුවලට සහාය වීමේ අවස්ථාව ලබා දෙනු ඇත.
- සියලු අංශවල පළමු තරඟ වටය පැවැත්වීමට පෙර විෂය ප්‍රවීනයන්ගේ සම්පත් දායකත්වයෙන් **භෞතික උපකාරක වැඩමුළු** පැවැත්වේ. (එම වැඩමුළුවලට **සහභාගි වීම අනිවාර්යය** වන අතර එම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පමණක් පළමු තරඟ වටයට පෙනී සිටීමේ අවස්ථාව හිමි වන බව සලකන්න.)
- උපකාරක වැඩමුළුවලට සහ පළමු තරඟ වටයට ඉදිරිපත් වන සියලු ම තරඟකරුවන්හට සහභාගිත්ව සහතික පත්‍ර පිරිනැමේ.
- **නර්තන හා ගායන අංශවල** ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන හිමි කරගනු ලබන තරඟකරුවන්හට මුදල් ත්‍යාග හා සහතික පත් ප්‍රදානය කැරේ.
- උපකාරක වැඩමුළු සහ තරඟ වට පැවැත්වෙන දිනයන් ඇතුළු තරඟාවලිය සම්බන්ධ සියලු දැනුවත් කිරීම් Vidumini WhatsApp සමූහ/ජපුර විදුමිණි WhatsApp චැනලය/ඊමේල් මගින් දැනුවත් කැරේ.
- එක් එක් තරඟ අංශවල පළමු වටයට අදාළ උපදෙස් වෙන් වෙන් වශයෙන් පහත දක්වා ඇත.
- අවසන් වටයට අදාළ විශේෂ උපදෙස් පළමු වටයේ ජයග්‍රාහකයන් වෙත පසු ව දැනුම් දෙනු ලැබේ.

නර්තන අංශය

- පළමු වටය සඳහා හිමි වන උපරිම කාලය මිනිත්තු 03 කි.
- අභිමත තේමාවක්/ සංකල්පයක් සහිත ව හෝ රහිත ව තම නර්තන ශක්‍යතාව මැනවින් පිළිබිඹු කළ හැකි ශාස්ත්‍රීය හෝ නිර්මාණාත්මක නර්තනයක් ඉදිරිපත් කළ හැකිය.
- නර්තනය සඳහා පටිගත කළ සංගීත ඛණ්ඩ හෝ සජීවී සංගීතය භාවිත කිරීමේ අවස්ථාව පවතී.
  - පටිගත කළ සංගීතය භාවිත කරනුයේ නම්, එය තම නම සහ ලියාපදිංචි අංකයෙන් rename කොට Pen Drive ආධාරයෙන් mp3 ගොනුවක් ලෙස එදිනට රැගෙන ආ යුතු ය.
  - සජීවී සංගීතය භාවිත කරනුයේ නම් අවශ්‍ය වාදන ශිල්පීන්/ගායන ශිල්පීන් සහ වාද්‍ය භාණ්ඩ අදාළ තරගකරු විසින් සපයා ගත යුතු ය.
- නර්තන නිර්මාණයට යෝග්‍ය වන පරිදි රංග භාණ්ඩ භාවිත කළ හැකිය.
- පළමු වටය සඳහා පසුතල නිර්මාණ භාවිත කළ නොහැක.
- පළමු වටයේ දී සුදුසු පුහුණු ඇඳුම් කට්ටලයකින් සැරසී සහභාගී වීම ප්‍රමාණවත් වේ.
- **නර්තන තරගයට ලියාපදිංචි වීම සඳහා 2026.11.30 හෝ එදිනට පෙර පහත ගූගල් පෝරමය සම්පූර්ණ කළ යුතු ය.** https://forms.gle/4pw2YjfNRhfGQXKC8

ගායන අංශය

- ගායනය සඳහා හිමි වන උපරිම කාලය මිනිත්තු 03 කි.
- තම ගායන ශක්‍යතාව මැනවින් පිළිබිඹු කළ හැකි ආකාරයේ අභිමත ගීතයක් ගායනා කිරීමේ හැකියාව පවතී.
- ඒ සඳහා පටිගත කළ සංගීතය කැරොකේ ආකෘතියෙන් භාවිත කළ යුතු ය. (එය තම නම සහ ලියාපදිංචි අංකයෙන් rename කොට Pen Drive ආධාරයෙන් mp3 ගොනුවක් ලෙස එදිනට රැගෙන ආ යුතු ය.)
- ගායනයට සුදුසු ඇඳුමකින් සැරසී ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.
- **ගායන තරගයට ලියාපදිංචි වීම සඳහා 2026.11.30 හෝ එදිනට පෙර පහත ගූගල් පෝරමය සම්පූර්ණ කළ යුතු ය.** https://forms.gle/uiNhHFHkUhxRgjnc9

තරගයට ඉදිරිපත් වන සියලු ම තරගකරුවන් **පිටු අංක 03හි දක්වා ඇති අයදුම්පත් ආකෘතිය** භාවිත කර තමා **ඉදිරිපත් වන තරග අංශ සඳහා වෙන වෙන ම අයදුම්පත්** සම්පූර්ණ කළ යුතු ය.

සියලු අයදුම්පත් පැහැදිලි අත් අකුරින් නිවැරදි ව පුරවා **උපකාරක වැඩමුළුව පැවැත්වෙන දින රැගෙන** විත් තරග සංවිධායක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වේ.

එදින අයදුම්පත් ඉදිරිපත් කරන තරගකරුවන්ට පමණක් පළමු තරග වටයට ඉදිරිපත් වීමේ අවස්ථාව හිමි වන බව කරුණාවෙන් සලකන්න.

තරගකරුගේ
ඡායාරූපය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය සමග
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

'විදුමිණි ප්‍රතිභා' නර්තන හා ගායන තරගාවලිය - 2026/2027

අයදුම් පත්‍රය

තරගකරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්)		
Full name (in English)		
අධ්‍යයන වර්ෂය		
ශිෂ්‍ය ලියාපදිංචි අංකය (පාස්පොතෙහි සඳහන් පරිදි)		
ඉදිරිපත් වන තරග කාණ්ඩය	1. නර්තන	
	2. ගායන	
දුරකථන අංකය (WhatsApp)		
ජාතික හැඳුනුම්පත් අංකය		
ලිපිනය		
විද්‍යුත් තැපැල් ලිපිනය		

ඉහත සපයා ඇති සියලු තොරතුරු මාගේ සත්‍ය තොරතුරු බව සහතික කරමි.

'විදුමිණි ප්‍රතිභා' නර්තන/ගායන තරගයේ සියලු තරග කොන්දේසිවලට එකඟ වන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය බැවින් ඊට එකඟ වන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

…….. ……..

දිනය අත්සන